## ඉංජිනේරු තාක්ෂණ ආයතනය- කටුනායක

ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම : ____________________

ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ ඇතුලත් වීමේ අංකය : ____________________

### විශේෂ ආධුනිකයින් විසින් අනිවාර්යයෙන් පිළිපැදිය යුතු විනය නීතිරීති

කිසියම් ආධුනිකයෙකු විසින් පහත සඳහන් ක්‍රියාවන් සිදුකිරීම මගින් විෂමාචාර පිළිබඳ වරදකරුවෙකු වන්නේය.

01. ආයතනයේ යම්කිසි දේපලක් විනාශකිරීම, හානිපැමිණවීම, විකෘතිකිරීම, අන්සතු කිරීම හෝ තමන් සතු කරගනු ලැබීම.

02. ආයතනික ව්‍යවස්ථාව, රෙගුලාසියක් හෝ නීතියක් උල්ලංඝනය කරනු ලැබීම.

03. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් නිකුත් කරනු ලබන කිසියම් නීත්‍යානුකූල නියමයන් පිළිපැදීම ප්‍රතික්ෂේප කරනු ලැබීම.

04. ඉ.තා. ආයතනයේ අධ්‍යයන මණ්ඩල මතය අනුව විනය ක්‍රියා මාර්ගයක් ගැනීමට ප්‍රමාණවත් හේතු ඇති චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් කිසියම් අධිකරණයක් මගින් වරදකරුවකු බවට තීරණය කරනු ලැබීම.

05. ආයතනයට සත්‍ය තොරතුරු දැන ගැනීමට හිමිකම් ඇති කිසියම් කාරණාවක් සම්බන්ධයෙන් ආයතනය වෙත අසත්‍ය තොරතුරු සපයනු ලැබීම.

06. ආයතන සීමාව තුල බීමත්ව හැසිරීම, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම, අදාල අය වෙතින් මත්පැන් ගඳ වහනයවීම, මත්පැන් හා මත්ද්‍රව්‍ය පරිභෝජනය කිරීම සහ සපයනු ලැබීම.

07. ආයතනයේ පුහුණු කටයුතු වලට සහ ආයතනයේ පරිපාලනයට බාධා පැමිණවිය හැකි හෝ ආයතනයේ නිලධාරියෙකුට හෝ සේවකයෙකුට සිය නිල කාර්ය ඉටුකිරීමට අවහිර විය හැකි කටයුතු වල නිරත වීම.

08. ආයතනය විසින් කලින් කල පනවනු ලබන නීති සහ විධිවිධානයන්ට පටහැනිව හෝ ආයතන පරිපාලනයේ අවසරයකින් තොරව හෝ ආයතන දේපල පරිහරණය කිරීම.

09. අධ්‍යක්ෂ/විදුහල්පතිතුමාගේ හැඟීම අනුව ආයතනයේ හොඳ නමට කැලැල් ඇතිකිරීම හෝ ආයතනය තුළ විනය හා පාලන පවත්වාගෙන යාමට බාධාකාරී වන අයුරින් හැසිරීම.

10. ආයතනයේ සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සමගියෙන් හා සහයෝගයෙන් කටයුතු නොකිරීම සහ කලහකාරී අයුරින් හැසිරීම.

11. අධ්‍යක්ෂ/විදුහල්පතිතුමාගේ අනුමැතිය ලිඛිතව නොලබා කිසියම් වාරප්‍රකාශනයක් හෝ පත්‍රිකාවක් බෙදාහැරීම හෝ ප්‍රදර්ශනය කිරීම සහ ආයතනයට අයිති දේපල විරූපී කිරීම හෝ විනාශ කිරීම.

12. අධ්‍යක්ෂ/විදුහල්පතිතුමාගේ ලිඛිත අනුමැතියකින් තොරව ආධුනිකයකු ලෙස හෝ ආධුනිකයින් වෙනුවෙන් හෝ ආයතනයේ ආධුනිකයින්ගේ ඉල්ලීම අනුව හෝ ආයතනයට පිටස්තර කිසියම් කථිකයෙකුට ආයතනය තුළ ආධුනිකයින් ඇමතීමට ආරාධනය කිරීම.

13. අධ්‍යක්ෂ/විදුහල්පතිතුමාගේ ලිඛිත අනුමැතියකින් තොරව ආයතන සීමාවන් තුළ කිසිඳු මුදල් හෝ භාණ්ඩ රැස්කිරීමක් සංවිධානය කිරීම කටයුතු සම්පාදනය කිරීම.

14. අධ්‍යක්ෂ/විදුහල්පති විසින් නම් කරන ලද ආචාර්යවරයෙකු හෝ නිලධාරියකුගේ අනුමැතියකින් තොරව ආයතනයට අදාළ කාරණා සම්බන්ධයෙන් ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කිරීම හෝ ප්‍රසිද්ධියට පත්කිරීමට කටයුතු කරනු ලැබීම.

15. ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිලධාරියක් හෝ ආරක්ෂක අංශ වල නිලධාරීන් ඉල්ලූ වහාම ආධුනිකයින් හට ආයතනය විසින් ලබාදී ඇති හැඳුනුම්පත ඉදිරිපත් නොකිරීම.

16. ආයතනය තුළ කවර ස්ථානයක හෝ තනි තනිව හෝ සමූහ වශයෙන් පුහුණු කටයුතු වලට කිසිසේත් අදාල බවට අධ්‍යයන මණ්ඩලයට පිළිගත නොහැකි ක්‍රියාකාරකම් වල යෙදීම.

17. නයිටා සභාපතිතුමාගේ හා ඉ.තා.ආ. අධ්‍යක්ෂ/විදුහල්පතිතුමාගේ අවසරයකින් තොරව නයිටා සහ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නිල ලාංඡන භාවිතා කිරීම.

ඉහත සඳහන් විෂමාචාරයන් සිදුකිරීමෙන් වළකින ලෙස තරයේ දන්වා සිටිමි.

..............................

ඩී.ආර්.සපුතන්තිරි

අධ්‍යක්ෂ/විදුහල්පති

ඉහත සඳහන් කරුණු මා කියවා හොඳින් තේරුම් ගත් බවටත් එම විෂමචාරයන්හි නොයෙදෙන බවටත් මෙයින් පොරොන්දු වෙමි.

| | | |
|---|---|---|
| .......................... | .................................. | ............................ |
| ශිෂ්‍යයාගේ අත්සන | දිනය | අත්සනට සාක්ෂි(මව/පියා/භාරකරු) |

Scanned with CamScanner

**INSTITUTE OF ENGINEERING TECNOLOGY-KATUNAYAKE**

Student Name : ..................................................................................

Admission No : ..................................................................................

**Disciplinary Rules & Regulations for the students of NDES Course**

Any apprentice, who does the following acts, will be a convict for misconduct.

1. Destructing, damaging, handing over or keeping in possession, the property of the Institute.
2. Violation of Institution, Construction, a regulation or a rule.
3. Refusal of following the legal instructions issued by the member of academic staff or member of administration.
4. Find guilty at a court for any offence which is a considerable reason, to take disciplinary action in the opinion of Board of Study of IET.
5. Providing false information to the Institute about a particular matter of which, the institute has the right to know the truth.
6. Being under the influence of liquor or smelling of liquor, bringing, keeping consuming or providing liquor or drugs or smoking within the IET Premises.
7. Wrongful behavior which is disturbing to the academic & administrative activities of officers and employees of the Institute.
8. Use of the Institutional property without the permission of the administration or violating the rules and regulations laid by the institute time to time.
9. Misconduct or Misbehavior affecting the smooth functioning and damage the reputations of the institute, in the opinion of Director/Principal or Board of studies.
10. Violent behavior and non-cooperation with apprentices.
11. Distributing or publication of leaflets without written permission of Director/ Principal.
12. Inviting a particular speaker to address the apprentices without written permission of the Director/Principal.
13. Collecting money or things in the institute without written permission of the Director/Principal.
14. Displaying any poster or Notices without the permission of the Director/Principal or lecturer, officer who is appointed by the Director/principal.
15. Failure to provide the IET Identity card and not surrender same to the staff or the security when called for.
16. Engage in unacceptable activities those of non relevant to studies or training, individually or group wise in any place of the institute.
17. Using NAITA logo & IET logo without permission of the Chairman NAITA & Director/Principal IET.

You are informed to follow the above rules and regulations, thoroughly.

...........................................................

D.R. Saputhantiri
Director/Principal

I do hereby certify that I have read & understood the above all the rules & regulations and agree not to engage in any of the above misconducts.

| | | |
|---|---|---|
| .................................... | ............................... | .................................................................... |
| Signature of Student | Date | Witness for Signature (Parent or Guardian) |

Scanned with CamScanner